# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2296/05 - 2022 සැප්තැම්බර් මස 06 වැනි අඟහරුවාදා - 2022.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නගර සභා ආඥාපනත

නියමය

(255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 14 වන වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1978 අගෝස්තු 10 වන දින අංක 329/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන නියමයකින් සංස්ථාපනය කරන ලද වවුනියාව නගර සභාව, වවුනියාව මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

දිනේෂ් ගුණවර්ධන,
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### මහා නගර සභා ආඥාපනත

#### නියමය

මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 2, 3, 5 සහ 9 වෙනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උප ලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි.

#### "වවුනියාව මහා නගර සභාව"

(4) වවුනියාව මහා නගර සභාව නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු ඇතුළු පහත දැක්වෙන i, ii සහ iii වන ඡේද ප්‍රකාර, තෝරා පත් කරගනු ලබන සහ තෝරා යවනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යැයි නියම කරමි.

i. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත්කරගත යුතු සභිකයින් දොළොස් දෙනෙකුගෙන්ද ;

ii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා යැවිය යුතු සභිකයින් අට දෙනෙකුගෙන්ද ;

iii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද ;

සමන්විත විය යුතුය.

(5) මෙම මහා නගර සභාවේ සභිකයින්ගේ ධුර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

#### I කොටස

පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම් වලින් සමන්විත භූමි ප්‍රදේශය :-

වවුනියාව නගරය (214) තාන්ඩිකුළම් (214 A), පට්ටානිච් පූලියන්කුලම (214 B), වවුනියාව නගරය උතුර (214 C), වෛරවපුලියන්කුළම (214 D), පණ්ඩාරිකුලම් (214 E), කොටසක්, තෝනික්කල් (214 F), කොටසක්, මූන්රුමුරිප්පු (214 G), කොටසක්, රම්බෛකුළම් (244 A), කෝවිල්කුළම (244 C) කොටසක්, වෙලික්කුළම් (244 D) කොටසක් වශයෙන්.

II කොටස

වවුනියාව මහා නගර සභාවේ පරිපාලන සීමා :-

උතුරට - කුලමාට්ටු මංසන්දියේ සිට පත්තිනියාර් - මහිලන්කුලම් මාර්ගය ඔස්සේ ඉරනෛඉලුප්පෙයික්කුළම් - තාණ්ඩිකුලම් මාර්ගය හමුවන ස්ථානය වන බණ්ඩාංක උ. 697980, නැ, 467021 ලක්ෂ්‍ය යේ සිට ඉරනෛඉලුප්පෙයිකුළම් - තාණ්ඩිකුලම් මාර්ගය ඔස්සේ ගිණිකොන දිශාවට කොළඹ - කන්කසන්තුරේ දුම්රිය මාර්ගය හමුවන බණ්ඩාංක උ. 696870, නැ, 468199 ලක්ෂ යේ සිට දුම්රිය මාර්ගය ඔස්සේ උතුරු දිශාවට ගොස් බණ්ඩාංක උ. 697170, නැ. 468212 ලක්ෂ්‍ය යේ සිට නැගෙනහිර දිශාව ඔස්සේ මහනුවර - යාපනය A9 මාර්ගය පසුකොට තාන්ඩිකුලම් කුඹුරු යායේ බස්නාහිර සීමාවේ බණ්ඩාංක උ.697119, නැ.468445 ලක්ෂ්‍ය යේ සිට ගිණිකොණ දිශාවට ගොස් තාණ්ඩිකුලම් වැව් බැම්මේ නැගෙනහිර සීමාවේ උ. 696687, නැ. 469185 ලක්ෂ්‍යට ළගා වී නැගෙනහිර දිශාවෙන් හමුවන මාර්ගය ඔස්සේ උ. 696592. නැ. 469574 යන ලක්ෂ්‍යය දක්වා ගොස් එතැන් සිට සාන්ත සෝලේ මාර්ගයේ බණ්ඩාංක උ. 696705, නැ. 469692 ලක්ෂ්‍යය දක්වා ;

නැගෙනහිරට - ඉහත උතුර මායිමේ අවසානයට සඳහන් ලක්ෂ්‍ය යේ සිට ශාන්ත සෝලේ මාර්ගය ඔස්සේ ගිණිකොණ දිශාවට බණ්ඩාංක උ. 695614 නැ. 470965 ලක්ෂ්‍ය හරහා නැවත ගිණිකොණ දිශාවේ පූන්තෝට්ටම් විද්‍යාපීඨ මාර්ගයේ බණ්ඩාංක උ. 695403, නැ. 470981 ලක්ෂ හරහා නැවත එම මාර්ගයේ බණ්ඩාංක උ. 695311, නැ. 471175 ලක්ෂ්‍යයෙන් දකුණු දිශාවට හැරී වවුනියාව වැවේහි නැගෙනහිර සීමාවේ පිහිටි පිළිවෙලින් බණ්ඩාංක උ.694886, නැ. 471198, උ. 694763, නැ. 471220 සහ උ. 694236, නැ. 471688 යන ලක්ෂ්‍යයන් හරහා ගිනිකොණ දිශාවට ගොස් වෙළිකුලම් - මාමඩුව මාර්ගයේ බණ්ඩාංක උ. 694004, නැ. 472040 ලක්ෂ්‍යය දක්වා ගොස් එතැන් සිට නිරිත දිශාවට මාර්ගය ඔස්සේ බණ්ඩාංක උ. 693569, නැ. 471791 දක්වා ගොස් එතැන් සිට නැගෙනහිර දිශාවට කුඹුර මැද ඇති මාර්ගය ඔස්සේ බණ්ඩාංක පිළිවෙලින් උ. 693553 නැ. 471917, උ. 693579 නැ. 471931, උ. 693556, නැ. 472021, උ. 693514, නැ. 472074, උ. 693493, නැ. 472151, උ. 693511, නැ. 472181, උ. 693412, නැ. 472371, උ. 693412, නැ. 472483, ලක්ෂයන් යා කරන සරල රේඛාවක් ඔස්සේ තෙඩුන්කුලම මාර්ගයේ බණ්ඩාංක උ.693392, නැ. 472568 ලක්ෂ්‍යට ළගා වී එතැන් සිට නිරිත දිශාවට ගොස් වවුනියාව හොරොව්පතාන (A29) මාර්ගයේ උ. 693015, නැ. 472377 යන ලක්ෂ්‍ය දක්වා ගොස් එතැන් සිට එම මාර්ගය ඔස්සේ නැගෙනහිර දිශාවට යන විට හමුවන අම්බලන්ගොඩැල්ල මංසන්ධිය වන බණ්ඩාංක උ. 692972, නැ. 472516 යන ලක්ෂ්‍ය දක්වා ;

දකුණට - ඉහත නැගෙනහිර මායිමේ අවසානයට සඳහන් ලක්ෂ්‍ය යේ සිට අම්බලන්ගොඩැල්ල මාර්ගය ඔස්සේ දකුණු දිශාවට ගොස් තෙට්කිල්ප්පෙක්කුළම් කෝවිල මංසන්ධියේ බණ්ඩාංක උ. 692278, නැ. 472512 යන ලක්ෂ්‍යයේ සිට වයඹ දිශාවට ඇති තෙට්කිල්ප්පෙක්කුළම් මාර්ගය ඔස්සේ බණ්ඩාංක උ. 692648, නැ. 471481 ලක්ෂ්‍යය වන සෙබස්තියන් කෝවිල් මංසන්දියේ සිට නිරිත දිශාවට ගොස් බණ්ඩාංක උ. 692511, නැ. 471428 ලක්ෂ්‍යය වන මංසන්දිය හරහා එතැන් සිට ගිණිකොණ දිශාවේ පිහිටි බණ්ඩාංක උ. 692488, නැ. 471496 ලක්ෂ්‍යය දක්වා ගොස් එතැන් සිට ඇති මාර්ගය ඔස්සේ දකුණු දිශාවට පිළිවෙලින් බණ්ඩාංක උ. 692229, නැගෙනහිර 471408 හා උ. 692236, නැ. 471378 යන ලක්ෂ්‍යයන් ඔස්සේ කොවිල්පුදුකුලම්, පස්වන පටුමග හමුවන බණ්ඩාංක උ. 692186, නැ. 471352 ලක්ෂ්‍යය දක්වා. එතැන් සිට ගිණිකොණ දිශාවට බණ්ඩාංක උ. 692113, නැ. 471474 දක්වා ගොස් නිරිත දිශාවට ඇති මාර්ගය ඔස්සේ බණ්ඩාංක උ. 691972, නැ. 471392 ලක්ෂ්‍යයට ගොස් නැවත ගිණිකොණ දිශාවට යන විට හමුවන බණ්ඩාංක උ. 691947, නැ. 471414 ලක්ෂ්‍යය දක්වාද එතැන් සිට නිරිත දිශාවට ඇති කම්බි පැල ඉනි වැට ඔස්සේ මාර්ගය හමුවන බණ්ඩාංක උ. 691741, නැ. 471307 ලක්ෂ්‍යය දක්වා ගොස් නැගෙනහිර දිශාවට මාර්ගය ඔස්සේ බණ්ඩාංක උ. 691734, නැ.471554 ලක්ෂ්‍යය දක්වා. එතැන් සිට නිරිත දිශාවට කම්බි පැල ඉනි වැට ඔස්සේ පිළිවෙලින් උ. 691659, නැ. 471533, උ. 691636, නැ. 471599 සහ උ. 691630 , නැ. 471710 යන ලක්ෂ්‍ය හරහා ගොස් කොවිල්පුදුකුළම්, 10 වන පටුමග හමුවන බණ්ඩාංක උ. 691528, නැ. 471666 යන ලක්ෂ්‍යය දක්වා ගොස් එතැන් සිට ඉහත කී 10 වන පටුමග ඔස්සේ වයඹ දිසාවට බණ්ඩාංක උ. 691547, නැ. 471620 යන ලක්ෂ්‍යය දක්වා ගොස් උමා මහේශ්වරන් මාර්ගය හමුවන බණ්ඩාංක උ. 691223, නැ. 471270 යන ලක්ෂ්‍යයට ළගාවී එතැන් සිට එම මාර්ගය ඔස්සේ ගිණිකොණ දිශාවට බණ්ඩාංක උ. 691130, නැ. 471349 යන ලක්ෂ්‍යය දක්වා ගොස් එතැන් සිට නිරිත දිශාවට කම්බි පැළ ඉනි වැට ඔස්සේ පිළිවෙලින් බණ්ඩාංක උ. 691083, නැ. 471299, අ. 691038, නැ. 471337 ලක්ෂ්‍යය හරහා බණ්ඩාංක උ. 690982, නැ. 471313 යන ලක්ෂ්‍යය දක්වා. එතැන් සිට කම්බි පැල ඉනි වැට ඔස්සේ වයඹ දිශාවට බණ්ඩාංක උ. 691259, නැ. 470652 ලක්ෂ්‍යය හරහා කොවිල් කුලම් ලක්ෂ්‍යය හරහා කොවිල්කුලම් වැව්බැම්ම ආරම්භයේ පිහිටි බණ්ඩාංක උ. 691283, නැ. 470637 ලක්ෂ්‍යය හා ඇල ආරම්භවන බණ්ඩාංක උ. 691146, නැ. 470453 ලක්ෂ්‍යයය හා ඇල ඔස්සේ ඇති බණ්ඩාංක උ. 690821, නැ. 470189 හා උ. 690764, නැ. 470239 වන ලක්ෂ්‍යයන් හරහා තච්චන්කුළම් සමළන් කුළම් මාර්ගය හමුවන බණ්ඩාංක උ. 690638, නැ. 470061 යන ලක්ෂ්‍යය දක්වා. එතැන් සිට නිරිත දිශාවට ඇති ඇල මාර්ගය ඔස්සේ පිහිටි බණ්ඩාංක උ. 690545, නැ. 470020, උ. 690561, නැ. 469930 හා උ. 690181, නැ. 469631 යන ලක්ෂ්‍යය හරහා ඉරට්ටපෙරියකුලම් ඔය හමුවන බණ්ඩාංක

උ. 689730, නැ. 468707 ලක්ෂ්‍යය හරහා බණ්ඩාංක උ. 689967, නැ. 468609 ලක්ෂ්‍යය ඔස්සේ වයඹ දිශාවට යන විට හමුවන මහනුවර - යාපනය (A9) මාර්ගයේ පිහිටි පාලමේ බණ්ඩාංක උ. 690070, නැ. 468364 යන ලක්ෂ්‍යය හරහා ඉරට්ටපෙරියකුලම් ඔය ඔස්සේ කොළඹ - කන්කසන්තුරේ දුම්රිය මාර්ගය හමුවන බණ්ඩාංක උ. 690082, නැ. 468308 යන ලක්ෂයය දක්වා.

බටහිරට - ඉහත දකුණු මායිමේ අවසානයට සඳහන් ලක්ෂ්‍යය සිට දුම්රිය මාර්ගය ඔස්සේ උතුර දිශාවට ගොස් බණ්ඩාංක උ. 693439, නැ. 469063 යන ලක්ෂ්‍යය සිට වයඹ දිශාවට හැරී "අමදි නිවසේ" දකුණු මායිම ඔස්සේ ගුඩ් ෂෙඩ් මාර්ගයේ බණ්ඩාංක උ. 693471, නැ. 468980 ලක්ෂ්‍යයේ සිට ඊසාන දිශාවට ගියවිට හමුවන බණ්ඩාංක උ. 693514, නැ. 469006 යන ලක්ෂ්‍යය වයඹ දිශාවට හැරී කම්බි වැට ඔස්සේ බණ්ඩාංක උ. 693558, නැ. 468953 ලක්ෂ්‍යය හරහා ඊසාන දිශාවට හැරී බණ්ඩාංක උ. 693572, නැ. 468965 යන ලක්ෂ්‍යය සිට නැවත වයඹ දිශාවට ගොස් වෛරවපුලියම්කුලම් වැවෙහි ගිණිකොණ සීමාවෙහි පිහිටි බණ්ඩාංක උ. 693608, නැ. 468918 ලක්ෂ්‍යය ළගා වී වැවේ දකුණු සීමාව ඔස්සේ පිහිටි බණ්ඩාංක උ. 693446, නැ. 468684, උ. 693476, නැ. 468778, උ. 693494, නැ. 468678 යන ලක්ෂ්‍යය දක්වා. එතැන් සිට බටහිර දිශාවට කම්බි වැට ඔස්සේ බණ්ඩාංක උ. 693488, නැ. 468583, උ. 693468, නැ. 468559 යන ලක්ෂ්‍යය හරහා උ. 693506, නැ. 468481 ලක්ෂ්‍යය දක්වා. එතැන් සිට නිරිත දිශාවට හැරී ගිය විට හමුවන මාර්ගයේ පිහිටි බණ්ඩාංක උ. 693451, නැ. 468457 ලක්ෂ්‍යයට පැමිණ මාර්ගය ඔස්සේ බණ්ඩාංක උ. 693479, නැ. 468403 ලක්ෂ්‍යයට ගොස් උතුරු දිශාවට හැරී වියාසර් වීදිය හමුවන මංසන්දිය වන බණ්ඩාංකා උ. 693511, නැ. 468338 ලක්ෂ්‍යය සිට වියාසර් මාර්ගය ඔස්සේ බටහිර දිශාවට ගොස් උක්කුලාම්කුලම් - තවසිකුලම් මාර්ගය හමුවන මංසන්දිය වන බණ්ඩාංක උ. 693513, නැ. 467778 ලක්ෂ්‍යය සිට උතුරු දිශාවට ඇති උක්කුලාම්කුලම් - පණ්ඩාරිකුලම් මාර්ගය ඔස්සේ පණ්ඩාරිකුලම් ට්‍රාන්ස්පෝමර් මංසන්දිය වන බණ්ඩාංක උ. 694327, නැ. 467770 යන ලක්ෂ්‍යය ළගාවී එතැන් සිට පාසල් පාර ඔස්සේ බටහිර දිශාවට යනවිට හමුවන සෙන්තුරන් හාල්මෝල පසුකොට නෙළුම්කුලම් වැවේ නැගෙනහිර දිශාවේ ඇති මාර්ගය හමුවන මංසන්දිය වන බණ්ඩාංක උ. 694354, නැ. 466629 වන ලක්ෂ්‍යයට ළගාවී එම මාර්ගය ඔස්සේ උතුරු දිශාවට හැරී වවුනියාව - මන්නාරම් මාර්ගය හමුවන බණ්ඩාංක උ. 694847, නැ. 466618 යන ලක්ෂ්‍යය දක්වා ගොස් එතැන් සිට මාර්ගය ඔස්සේ බටහිර දිශාවට ගොස් බණ්ඩාංක උ. 694847, නැ. 466601 ලක්ෂ්‍යය සිට වෙප්පන්කුලම්, 7 වන පටුමග ඔස්සේ උතුරු දිශාවට ගොස් එම පටුමග නැගෙනහිර දිශාවට හැරෙන මංසන්දිය වන බණ්ඩාංක උ. 696300, නැ. 466612 යන ලක්ෂ්‍යයේ සිට වයඹ දිශාවට ගොස් පට්ටකාඩු වැවේ දකුණු මායිම වන බණ්ඩාංක උ. 696352, නැ. 466580 හා උ. 696421, නැ. 466352 ලක්ෂ්‍යයන් හරහා උතුර දිශාවට ගොස් බණ්ඩාංක උ. 696603, නැ. 466375 ලක්ෂ්‍යය හරහා වැව් බැම්ම ඔස්සේ ඇති මාර්ගය හමුවන බණ්ඩාංක උ. 6966791, නැ. 466424 යන ලක්ෂ්‍යය හරහා වැව් බැම්මේ මාර්ගය ඔස්සේ වයඹ දිශාවට ගොස් කුළුමාට්ටු මංසන්දිය - පන්තිනියාර්මහිලන්කුලම් මාර්ගය හමුවන බණ්ඩාංක උ. 696838, නැ. 466358 ලක්ෂ්‍යය සිට මාර්ගය ඔස්සේ ඊසාන දිශාවට ගොස් උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා.

EOG 9 - 0038/1

---

**නගර සභා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 14 වන වගන්තියේ (ඈ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1978 අගෝස්තු 10 වන දින අංක 329/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන නියමයකින් සංස්ථාපනය කරන ලද කළුතර නගර සභාව, කළුතර මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**මහා නගර සභා ආඥාපනත**

නියමය

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 2, 3, 5 සහ 9 වෙනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි.

**"කළුතර මහා නගර සභාව"**

(4) කළුතර මහා නගර සභාව නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු ඇතුළු පහත දැක්වෙන i, ii සහ iii වන ඡේද ප්‍රකාර, තෝරා පත් කරගනු ලබන සහ තෝරා යවනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යැයි නියම කරමි.

i. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත්කරගත යුතු සභිකයින් දහනව දෙනෙකුගෙන්ද ;

ii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා යැවිය යුතු සභිකයින් දොළොස් දෙනෙකුගෙන්ද ;

iii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද ;

සමන්විත විය යුතුය.

(5) මෙම මහා නගර සභාවේ සභිකයින්ගේ ධුර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I වන කොටස

පහත සඳහන් ග්‍රාම නිළධාරී වසම් වලින් සමන්විත භූමි ප්‍රදේශය :-

717D දේශාස්ත්‍ර කළුතර බටහිර, 717C විද්‍යාසාර, 717A දේශාස්ත්‍ර කළුතර, 717B තොටුපල, 717 කළුතර උතුර, 725 කළුතර දකුණ, 725B වේලාපුර, 727B කුඩා හීනටියන්ගල, 727 මහවත්ත, 727E අක්කරගොඩ, 725A කළුතර දකුණ, 730 වෙට්ටුමකඩ දකුණ, 727C කුරුඳුවත්ත, 730A කලපුව, 730B කටුකුරුන්ද, 729B නාගොඩ බටහිර, 718 එතනමඩල, 718B බොට්නික්වත්ත, 723B ඉලුක්වත්ත, 723D විලේගොඩ දකුණ, 727A ඇටවිල, 727D මහා හීනටියන්ගල, 727F වත්තමුල්ල, 729 නාගොඩ දකුණ, 729A අළුබෝගහලන්ද, 729D ගල්ලස්ස, 729F උස්වත්ත, 729E කජුදූව වත්ත, 729I වෙනිවැල්කැටිය, 732 ඇතගම නැගෙනහිර, 732A ඇතගම බටහිර, 731 කලමුල්ල උතුර, 731A කලමුල්ල දකුණ, 731B කලමුල්ල නැගෙනහිර.

II කොටස

කළුතර මහා නගර සභාවේ පරිපාලන සීමා :-

උතුරට - මුහුදු වෙරළ තීරයේ සිට කොට්ඨාස අංක 15 මහාවස්කඩුව කොට්ඨාසයේ 714 මහා වස්කඩුව ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම සහ කොට්ඨාස අංක 16 විල්ලෙගොඩ උතුර කොට්ඨාසයේ, 718 සී විල්ලෙගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම, 718 ඒ ජාවත්ත ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම, 718 ඩී මල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම අයත්වේ.

නැගෙනහිරට - කොට්ඨාස අංක 17 එතනමඩල කොට්ඨාසයේ, 718 එතනමඩල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම සහ එතැන් සිට එම වසමේ නැගෙනහිර මායිම අවසන් වන ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට කොට්ඨාස අංක 18 හි 723F, තේක්කවත්ත වසමෙහි උතුරු මායිම සහ එම කොට්ඨාසයෙහි 723E පලාතොට ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර මායිමද සහ කොට්ඨාස අංක 21 ඇටවිල කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම්ද සහ කොට්ඨාස අංක 22 මහා හීනටියන්ගල හි නැගෙනහිර මායිමද සහ කොට්ඨාස අංක 23 හි 729A අළුබෝගහලන්ද ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිමද සහ එම කොට්ඨාසයේ 729 නාගොඩ දකුණ වසමේ උතුරු සහ නැගෙනහිර මායිම්ද සහ කොට්ඨාස අංක 24 වෙනිවැල්කැටිය කොට්ඨාසයේ නැගෙනහිර මායිමද අයත් වේ.

දකුණට - කොට්ඨාස අංක 24 වෙනිවැල්කැටිය හි දකුණු මායිමද සහ කොට්ඨාස අංක 24 සහ 25 හි දකුණු මායිම් අතර පිහිටා ඇති 729B නාගොඩ බටහිර වසමේ දකුණු මායිම ද, කොට්ඨාස අංක 25 ඇතගම හි දකුණු මායිම මුහුදු වෙරළ, තීරය දක්වා අයත් වේ.

බටහිරට - ඉහත සඳහන් කොට්ඨාස අංක 25 ඇතගම හි දකුණු මායිම අවසන් ලක්ෂ්‍යයේ සිට වෙරළ තීරය දිගේ කොට්ඨාස අංක 15 මහා වස්කඩුව කොට්ඨාසයේ උතුරු මායිම දක්වා අයත් වේ.

EOG 9 - 0038/2

---

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1987 මැයි මස 12 වන දින අංක 453/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් සංස්ථාපනය කරන ලද කළුතර ප්‍රාදේශීය සභාව, සීමා මායිම් සංශෝධනය සහ සභික සංඛ්‍යාව සංශෝධනය කර නව ප්‍රාදේශීය සභාවක් මඟින් ඒ ප්‍රාදේශීය සභාව පුනස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන්, 4 වන වගන්තියෙන්, 6 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශිත ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර, එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

"කළුතර ප්‍රාදේශීය සභාව"

(4) කළුතර ප්‍රාදේශීය සභාව,

i. ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ තෝරා පත්කර ගත යුතු සභිකයන් දහනව දෙනෙකුගෙන් ද ;

ii. ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරා යැවිය යුතු සභිකයන් දොළොස් දෙනෙකුගෙන් ද ;

iii. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 65ආ වගන්තියේ (4) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද ;

සමන්විත විය යුතු යැයි නියම කරමි.

(5) කළුතර ප්‍රාදේශීය සභාවේ ධූර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I වන කොටස

පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම්වලින් සමන්විත භූමි ප්‍රදේශය :-

701 මහා ගෝනදූව, 701A කුඩා ගෝනදූව, 706 මොරොන්තුඩුව උතුර, 706A නාන්දූව, 706B මොරොන්තුඩුව දකුණ, 700 මැස්ටිය, 705 මහරැක්ම, 705A මාවල දකුණ, 705B මාවල, 703 මැලැගම උතුර, 703A හබරලගහලන්ද, 703B මැලැගම දකුණ, 707 පොහොද්දරමුල්ල නැගෙනහිර, 707A පොහොද්දරමුල්ල බටහිර, 708 පොතුපිටිය උතුර, 708A පොතුපිටිය දකුණ, 708B පොතුපිටිය නැගෙනහිර, 708C පොතුපිටිය බටහිර, 708D මැද පොතුපිටිය, 709A දෙල්දූව, 709B නුගගොඩ, 709D අරියගම, 709 කලපුගම නැගෙනහිර, 709C කලපුගම බටහිර, 712 පරදූව, 713 දියගම, 713A දොඩම්මුල්ල, 711 පනාපිටිය දකුණ, 711A රන්නුංගල, 711B පනාපිටිය උතුර, 711C උස්ගොඩැල්ල, 716 උග්ගල්බොඩ නැගෙනහිර, 716B විජේරත්න වත්ත, 716A උග්ගල්බොඩ බටහිර, 715 දෙදියවල, 715A කපුහේන, 710 කුඩා වස්කඩුව උතුර, 710 C කුඩා වස්කඩුව නැගෙනහිර, 710A කුඩා වස්කඩුව දකුණ, 710B කුඩා වස්කඩුව බටහිර, 714 මහ වස්කඩුව දකුණ, 714A මහවස්කඩුව උතුර, 718 C විලේගොඩ උතුර, 718A ජාවත්ත, 718D මල්වත්ත, 723E පලාතොට, 723F තේක්කවත්ත, 723C ගොඩපරගහහේන, 723 කිතුලාව, 723A අල්විස්වත්ත, 729 C පුලර්ටන්වත්ත, 729H රජවත්ත පැරණි කොටස, 729G රජවත්ත අළුත් කොටස.

II කොටස

කළුතර ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :-

උතුරට - මුහුදු වෙරළ තීරයේ සිට කොට්ඨාස අංක 5 පොහොද්දරමුල්ල කොට්ඨාසයේ උතුරු මායිම ද, එම අවසන් ලක්ෂයේ සිට කොට්ඨාස අංක 4 මැලෑගම කොට්ඨාසයේ බටහිර සහ උතුරු මායිම් ද, එම අවසන් ලක්ෂයේ සිට කොට්ඨාස අංක 3 මාවල කොට්ඨාසයේ බටහිර සහ උතුරු මායිම් ද සහ එම අවසන් ලක්ෂයේ සිට කොට්ඨාස අංක 1 ගෝනදූව කොට්ඨාසයේ උතුරු මායිම ද අයත් වේ.

නැගෙනහිරට - ඉහත සඳහන් අංක 1 ගෝනදූව කොට්ඨාසයේ උතුරු මායිමේ අවසන් ලක්ෂයේ සිට එම කොට්ඨාසයේ නැගෙනහිර මායිම ද, කොට්ඨාස අංක 2 මොරොන්තුඩුව කොට්ඨාසයේ නැගෙනහිර මායිම ද එම අවසන් ලක්ෂයේ සිට කොට්ඨාස අංක 8 කලපුගම හි නැගෙනහිර මායිම, කොට්ඨාස අංක 9 දියගම හි උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද එතැන් පටන් කොට්ඨාස අංක 9 දියගම හි නැගෙනහිර සහ දකුණු මායිම්ද එතැන් පටන් කොට්ඨාස අංක 10 පනාපිටිය හි දකුණු මායිම ද, එතැන් පටන් කොට්ඨාස අංක 11 උග්ගල්බොඩ හි දකුණ මායිම ද කොට්ඨාස අංක 18 පලාතොට හි උතුරු මායිම ආරම්භය දක්වාත් එතැන් පටන් කොට්ඨාස අංක 18 පලාතොට හි නැගෙනහිර මායිම ද, කොට්ඨාස අංක 19 කිතුලාව හි නැගෙනහිර සහ දකුණු මායිම් ද එතැන් පටන් කොට්ඨාස අංක 20 පුලර්ටන් හි නැගෙනහිර මායිම් ද අයත් වේ.

දකුණට - ඉහත කොට්ඨාස අංක 20 පුලර්ටන් හි නැගෙනහිර මායිමේ හි අවසන් ලක්ෂ්‍යයේ සිට එම කොට්ඨාසයේ දකුණු මායිම ද එතැන් පටන් එම කොට්ඨාසයේ බටහිර මායිම, කොට්ඨාස අංක 21 ඇටවිල හි උතුරු මායිම ආරම්භය දක්වා එතැන් පටන් එම කොට්ඨාසයේ උතුරු මායිම ද අයත් වේ.

බටහිරට - ඉහත කොට්ඨාස අංක 21 ඇටවිල හි උතුරු මායිම ආරම්භක ලක්ෂ්‍යයේ සිට කොට්ඨාස අංක 18 පලාතොට කොට්ඨාසයේ 723E පලාතොට ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර සහ උතුරු මායිම ද, එම කොට්ඨාසයේ 723F තේක්කවත්ත ග්‍රාම නිලධාරී වසමෙහි උතුර මායිම කොට්ඨාස අංක 11 උග්ගල්බොඩ දකුණු මායිම දක්වාත් එතැන් පටන් කොට්ඨාස අංක 11 උග්ගල්බොඩ බටහිර මායිම ද කොට්ඨාස අංක 16 විලේගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම ආරම්භය දක්වාත් එතැන් පටන් එම කොට්ඨාසයේ දකුණු සහ බටහිර මායිම කොට්ඨාස අංක 15 හි මහවස්කඩුව කොට්ඨාසයේ දකුණු මායිම ආරම්භය දක්වාද එම කොට්ඨාසයේ දකුණු මායිම මුහුදු වෙරළ තීරය දක්වාද එතැන් පටන් මුහුදු වෙරළ තීරය දිගේ උතුරු මායිම ආරම්භය දක්වා වේ.

EOG 9 - 0038/3

---

**නගර සහා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 14 වන වගන්තියේ (ඈ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1978 අගෝස්තු 10 වැනි දින අංක 329/8 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන නියමයකින් සංස්ථාපනය කරන ලද කෑගල්ල නගර සභාව, කෑගල්ල මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මහා නගර සභා ආඥාපනත

නියමය

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 2, 3, 5 සහ 9 වෙනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි,

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි,

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි.

"කෑගල්ල මහා නගර සභාව"

(4) කෑගල්ල මහා නගර සභාව නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු ඇතුළු පහත දැක්වෙන i, ii සහ iii වන ඡේද ප්‍රකාර, තෝරා පත් කරගනු ලබන සහ තෝරා යවනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යැයි නියම කරමි:

i. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත් කරගත යුතු සභිකයින් දොළොස් දෙනෙකුගෙන් ද ;

ii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා යැවිය යුතු සභිකයින් අට දෙනෙකුගෙන් ද ;

iii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින් ද ;

සමන්විත විය යුතු ය.

(5) මෙම මහා නගර සභාවේ සභිකයින්ගේ ධුර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I කොටස

පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම්වලින් සමන්විත භූමි ප්‍රදේශය :-

රංවල 51A, ගොලහැල 51E, කෑගල්ල නගරය 51B, මීපිටිය 51G

II කොටස

කෑගල්ල මහා නගර සභාවේ පරිපාලන සීමා :-

උතුරට - කෑගල්ල පොල්ගහවෙල මාර්ගයේ මධ්‍ය රේඛාව හා වඩුගමුව ඇලේ මධ්‍ය රේඛාව ද කැපී යන ලක්ෂ්‍යයේ වූ කෑගල්ල පොල්ගහවෙල පාරේ පිහිටි අංක 7/8 දරන බෝක්කුවේ මැද සිට අංක 349923 (3019 සබර දරන හිමිකම් පිඹුරේ පළමුවන ඉඩම් කොටසේ) දරන හිමිකම් ඔප්පුවේ උතුරු මායිම ඊසාන දෙසට දික් කිරීමෙන් වූ සරකියුලර්

පාරේ උතුරු මායිමේ පිහිටි ලක්ෂ්‍යයට ඍජු රේඛාවක් වශයෙන් නැගෙනහිර දෙසට ද එතැන් සිට ඒ සර්කියුලර් පාරේ උතුරු මායිම ඔස්සේ, සබරගමුව 3609 දරන හිමිකම් පිඹුරේ 25 වැනි ඉඩම් කොටසේ ගිනිකොණ කෙළවරේ පිහිටි මිරිහැල්ල හා කැගල්ල ග්‍රාමයන් අතරේ වූ පොදු ග්‍රාම මායිම හමුවන තුරු ගිනිකොණ දෙසට ද, ඊසාන දෙසට ද, නැවතත් ගිනිකොණ දෙසට ද, එතැන් සිට එය මිරිහැල්ල හා කැගල්ල ග්‍රාම අතරේ වූ එකී පොදු මායිම ඔස්සේ එකී මායිම ගිනිකොණ දෙසට හැරෙන ලක්ෂ්‍යයක් දක්වා උතුරු දෙසට හා නැගෙනහිර දෙසට ද, එතැන් සිට එය කැගල්ල රඹුක්කන පාර හා පුවක්දෙනිය පාර ද සන්ධි වන ස්ථානය මැද සමඟ වූ ඍජු රේඛාවක් ඔස්සේ නැගෙනහිර දෙසට අඳින රේඛාවකින් ද ;

නැගෙනහිරට - අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඍජු රේඛාවක් ඔස්සේ නාගොල්ල ඇළ හා දෙල්ගහ වල ඇළ හමුවන ස්ථානයේ මැද පිහිටි ලක්ෂ්‍යයක් හමුවන සේ ගිනිකොණ දෙසට ද එතැන් සිට එය කොළඹ/මහනුවර මහා මාර්ගය හරහා යන ඍජු රේඛාවක් ඔස්සේ රද්දල ඇළේ මධ්‍ය රේඛාවේ ලක්ෂ්‍යයක් දක්වා ගිණිකොණ දෙසට අඳින ලද රේඛාවකින් ද ;

දකුණට - අවසන් වරට ලකුණු කරන ලද ලක්ෂ්‍යයේ සිට රදල්ල ඇළේ මධ්‍ය රේඛාව ඔස්සේ එය රදල්ල පාරේ මධ්‍ය රේඛාව හමුවන තුරු නිරිත දෙසටද එතැන් සිට එය, එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එකී පාර පහළවල ඇළට යන දේවාල පාර සමග සංධිවන ස්ථානයේ මැද දක්වා ගිණිකොණ දෙසටද එතැන් සිට එය පහළවෙල ඇළේ මධ්‍ය රේඛාව ඔස්සේ, ඇකිරියගල ගම්සභා පාරට සම්බන්ධ ගම්සභා පාර පටන් ගන්නා ස්ථානයේ වූ එකී ඇළ රද්දල ඇළ සමඟ එක්වන ස්ථානය දක්වා වයඹ දෙසටද එතැන් සිට එය ගම්සභා පාරේ දකුණු කෙළවර අද්දර ඔස්සේ එය ඇකිරියගල ගම්සභා පාරේ නැගෙනහිර කෙළවර අතර දක්වා බටහිර දෙසටද එතැන් සිට එය ඇකිරියගල පාරේ නැගෙනහිර කෙළවර අද්දර ඔස්සේ එය ගලේ පන්සලේ උතුරු මායිමේ ලක්ෂ්‍යයක් හමුවන තුරු දකුණු දෙසටද එතැන් සිට එය එකී ගලේ පන්සලේ උතුරු මායිම හා විල්ප්‍රඩ් විසින් හිමිකම් කියා සිටින හිවලමඩු වත්ත නැමැති ඉඩමේ උතුරු මායිමද ඔස්සේ එය ගම්සභා අඩිපාර හමුවන තුරු බටහිර දෙසටද එතැන් සිට එය ඍජු රේඛාවක් ඔස්සේ එච්. ආර්. පොඩිඅප්පුහාමි විසින් හිමිකම් කියා සිටින පින්නගොල්ල වත්ත නමැති ඉඩමේ දකුණු මායිමේ නැගෙනහිර අන්තයේ ලක්ෂ්‍යයක් දක්වා බටහිර දෙසටද එතැන් සිට එය එකී දකුණු මායිම හා එහි දික්කිරීමක් ඔස්සේ එය කැගල්ල බුලත්කොහුපිටිය පාරේ ලක්ෂ්‍යයක් හමුවනතුරු බටහිර දෙසටද එතැන් සිට එය එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නාදෙණියවත්තේ පිහිටි තුන්වැනි නගර සභා මායිම්ගලට ඍජු රේඛාවක් වශයෙන් පිහිටි ලක්ෂ්‍යයක් දක්වා වයඹ දෙසටද, එතැන් සිට එය ඍජු රේඛාවක් ඔස්සේ එකී නගර සභා මායිම්ගල දක්වා බටහිර දෙසටද එතැන් සිට එය නගර සභා මායිම් ගල සමග විස්තර කර ඇති මායිම ඔස්සේ සබරගමු 3406 හිමිකම් පිඹුරේ අංක 04 දරන ඉඩම් කැබැල්ලේ දකුණු කෙළවර ලක්ෂ්‍යයේ පිහිටි බිම් සලකුණ දක්වා වයඹ දෙසටද, එතැන් සිට එය එකී ඉඩම් කැබැල්ලේ බටහිර මායිම ඔස්සේ 3 සබරගමුව 3494 දරන හිමිකම් පිඹුරේ අංක 03 දරන ඉඩම් කැබැල්ලේ ගිණිකොණ කෙළවරේ වූ බිම් සලකුණ දක්වා වයඹ දෙසටද එතැන් සිට එය එකී ඉඩම් කැබැල්ලේ දකුණු මායිම හා එකී හිමිකම් පිඹුරේ එකී ඉඩම් කැබැල්ලේ හා අංක 1 හා 2 දරන ඉඩම් කැබලිවලද බටහිර මායිම් ඔස්සේ, සුසානභූමි පාරේ දකුණු මායිමේ ඇති එකී අංක 1 දරන ඉඩම් කැබැල්ලේ වයඹ කෙළවර ඇති බිම් සලකුණ දක්වා බටහිර දෙසට හා උතුරු දෙසටද එතැන් සිට එය එකී පාරේ දකුණු මායිම ඔස්සේ සබරගමුව 3406 දරන හිමිකම් පිඹුරේ අංක 1 දරන ඉඩම් කැබැල්ලේ ගිණිකොණ කෙළවරේ ඇති නගර සභා මායිම්ගල දක්වා වයඹ දෙසටද එතැන් සිට එය එකී අංක 01 දරන ඉඩම් කැබැල්ලේ දකුණු මායිම ඔස්සේ එහි නිරිතදිග කෙළවර දක්වා බටහිර දෙසටද එතැන් සිට එය, නගර සභා මායිම් ගල් මගින් විස්තර කෙරෙන මායිම ඔස්සේ මහඹවිට වත්තේ පිහිටි නගර සභා මායිම්ගල දක්වා නිරිත දෙසට හා වයඹ දෙසට ද එතැන් සිට සබරගමුව 234 දරන මුල් පිඹුරේ U32 (වෙළන්දෙණිය හෝ බරවාදෙණිය) දරන ඉඩම් කැබැල්ලේ නැගෙනහිර මායිම වූ ඍජු රේඛාව ඔස්සේ බටහිර දෙසටද එතැන් සිට එය බරවාදෙණිය කුඹුරේ නැගෙනහිර මායිම ඔස්සේ කොළඹ/මහනුවර මහා මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට යාර 100ක් දකුණු දෙසට ඇති ලක්ෂ්‍යක් හමු වන තුරු වයඹ දෙසටද එතැන් සිට එය කොළඹ/මහනුවර මහා මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට යාර 100ක් දුරින් හා ඊට සරල සමාන්තරව අඳින් ලද රේඛාවක් ඔස්සේ එකී රේඛාව අඹන්පිටිය වත්ත පාරේ මධ්‍ය රේඛාව සමගින් කැපී යන තෙක් බටහිර දෙසටද දකුණු දෙසටද හා නිරිත දෙසටද අඳින ලද රේඛාවකින්ද,

බටහිරට - අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අඹන්පිටිය වත්ත පාරේ මධ්‍ය රේඛාවේ සිට එය කොළඹ/ මහනුවර මහා මාර්ගය සන්ධිවන ස්ථානයේ මැද දක්වා උතුර දෙසටද එතැන් සිට එය ඍජු රේඛාවක් ඔස්සේ කොළඹ/මහනුවර මහා මාර්ගයේ මධ්‍ය රේඛාවෙන් යාර 10ක් උතුරෙන් පිහිටි ලක්ෂ්‍යයක් දක්වා උතුර දෙසටද එතැන් සිට එය කොළඹ/මහනුවර පාරේ අංක 46/11 දරන බෝක්කුවේ මැද සිට උතුර දෙසට අඳින ලද ඍජු රේඛාව ඔස්සේ අඹන්පිටිය කුඩාඔය *නොහොන්* කුඩා ඇළේ මැද දක්වා දකුණු දෙසටද එතැන් සිට එය එකී කුඩා ඔයේ *නොහොන්* කුඩා ඇළේ මධ්‍ය රේඛාව ඔස්සේ එය කැගලු ඔය සමඟ එක්වන ස්ථානය දක්වා උතුරු දෙසටද එතැන් සිට එය කැගලු ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ එය වඩුගම ඇළ සමඟ එක්වන ස්ථානය දක්වා නැගෙනහිර දෙසටද එතැන් සිට එය වඩුගම ඇළේ මධ්‍ය රේඛාව ඔස්සේ ප්‍රදේශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින්ද වේ.

මෙම සීමා මායිම් 1978 අගෝස්තු 10 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත සීමා මායිම් වලින් ලබා ගත් උදෘතයක් බව සඳහන් කරමු.

EOG 9 - 0038/4

---

**නගර සභා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥා පනතේ 14 වන වගන්තියේ (ඈ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1978 අගෝස්තු 10 වැනි දින අංක 329/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන නියමයකින් සංස්ථාපනය කරන ලද පුත්තලම මහ නගර සභාව, පුත්තලම මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**මහා නගර සභා ආඥාපනත**

නියමය

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 2, 3, 5 සහ 9 වෙනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි.

**"පුත්තලම මහා නගර සභාව"**

(4) පුත්තලම මහා නගර සභාව නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු ඇතුළු පහත දැක්වෙන i, ii සහ iii වන ඡේද ප්‍රකාර, තෝරා පත් කරගනු ලබන සහ තෝරා යවනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යැයි නියම කරමි.

i. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා යැවිය යුතු සභිකයින් එකොළොස් දෙනෙකුගෙන්ද ;

ii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා යැවිය යුතු සභිකයින් හත් දෙනෙකුගෙන්ද ;

iii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද ;

සමන්විත විය යුතුය.

(5) මෙම මහා නගර සභාවේ සභිකයින්ගේ ධුර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

### I වන කොටස

පහත සඳහන් ග්‍රාම නිලධාරි වසම්වලින් වසමන්විත භූමි ප්‍රදේශය :-

මරික්කාර් වීථිය 617/C, පරණ ජුම්මා පල්ලිය 617/D, පුත්තලම නැගෙනහිර 617/B, පුදුකුඩිරිප්පුව 617/F, පුත්තලම උතුර 617, පෙරිය පල්ලි කුඩිරිප්පුව 617/E, පුත්තලම දකුණ 618, සේනකුඩිරිප්පුව 616, තිල් අඩිය 618/A.

### II කොටස

පුත්තලම මහා නගර සභාවේ පරිපාලන සීමා :-

පුත්තලමෙහි පිහිටි පහත සඳහන් සීමාවලින් වටවූ මුළු බිම් ප්‍රදේශය :-

උතුරට - අංක 84842 දරන හිමිකම් පිඹුරේ උතුරු අන්තයේ සිට එකී හිමිකම් පිඹුරේ උතුරු සීමාව ඔස්සේ නැගෙනහිර දෙසට ද ; එතැන් සිට අංක 103236 දරණ හිමිකම් පිඹුරේ උතුරට ද ; අංක 1806767 දරන හිමිකම් පිඹුරේ බස්නාහිරට සහ උතුරට ද ; අංක 103238, 103239, 140289, 175585, 175584 දරණ හිමිකම් පිඹුරුවල බස්නාහිරට සහ උතුරට ද අංක 175580, 174668 දරන හිමිකම් පිඹුරු මැදින් ද, අංක 190445 දරන හිමිකම් පිඹුරේ උතුරට ද ඇදි පුරුක් 30 හේ රිසර්වේෂම ඔස්සේ අංක 174668 දරන හිමිකම් පිඹුරේ ගිණිකොණ කෙළවරට පුරුක් 30 ක් දකුණින් පිහිටි ලක්ෂ්‍යය දක්වා ද ;

නැගෙනහිරට - අන්තිමට කී ලක්ෂ්‍යයේ සිට අංක 66037 දරන හිමිකම් පිඹුරේ නිරිතදිග කෙළවර හමුවන තෙක් ගිණිකොණ දෙසට ඇඳි රේඛාවකින් ද, එතැන් සිට අංක 66037, 66038, 59380 දරන හිමිකම් පිඹුරුවල නැගෙනහිර මායිම ඔස්සේ ද, එතැන් සිට අංක 59383, 62610, 137574, 62611, 59384, 53327, 62623, 62616 සහ අංක 137595 දරන හිමිකම් පිඹුරුවලට නැගෙනහිරින් ඇති මාර්ග රිසර්වේෂම ඔස්සේ ද, එය අංක 137595 දරන හිමිකම් පිඹුරේ දකුණින් පිහිටි මාර්ග රිසර්වේෂම හමුවන තැන් දක්වා ද ;

දකුණට - අන්තිමට කී ලක්ෂ්‍යයේ සිට අංක 137595, 146288, 189076, 58701, 114943, 114941, 114942, 135235, 135234, 62619, 62629 දරන හිමිකම් පිඹුරුවල දකුණින් පිහිටි මාර්ග රිසර්වේසම (ආනෙයි පිල්ලේ උතු වවුන්) දකුණු මායිම ඔස්සේ බස්නාහිර දෙසට ද, එතැන් සිට අංක 157927 දරන හිමිකම් පිඹුරේ නැගෙනහිරින් පිහිටි මාර්ග රිසර්වේෂම නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ද, එතැන් සිට අංක 157927, 239377, 147378 සහ 222050 දරන හිමිකම් පිඹුරුවල දකුණින් පිහිටි මාර්ග රිසර්වේෂමේ දකුණු මායිම ඔස්සේ බස්නාහිර දෙසට ද, එතැන් සිට පුත්තලම කලපුව දක්වා බස්නාහිර දෙසට හරි කෙලින් අඳින ලද රේඛාවකින් ද ;

බටහිරට - අන්තිමට කී ලක්ෂ්‍යයේ සිට පුත්තලම කලපුවේ නැගෙනහිර සීමාව ඔස්සේ පිටාර ඇළ (පී. පී. 3637) දක්වා ඊසාන දෙසට සහ වයඹ දෙසට ඇඳි රේඛාවකින් ද ; එතැන් සිට පිටාර ඇළ ඔස්සේ බටහිර ලේවාය පාර හමුවන තෙක් ඊසාන දෙසට ද ; එතැන් සිට බටහිර ලේවාය පාර ඔස්සේ එම පාර මන්නාරම-පුත්තලම පාර හා සන්ධිවන ස්ථානය දක්වා ගිණිකොණ දෙසට ද, එතැන් සිට මන්නාරම-පුත්තලම පාර ඔස්සේ එම්. එස්. පී. පී. 20 දරන මිශ්‍ර මිණුම් සැලැස්මේ අංක 232 දරන බිම් කැබැල්ලේ උතුරු මායිමේ පිහිටි බිම් සලකුණ දක්වා උතුරු දෙසට ද, එතැන් සිට එකී බිම් සලකුණේ පටන් පී. පී. 5509 දරන සැලැස්මේ 6 වැනි බිම් කැබැල්ලේ නිරිත දිග කෙළවර පිහිටි බිම් සළකුණ දක්වා ඊසාන දෙසටද, එතැන් සිට පී. පී. 5509 දරන සැලැස්මේ අංක 12, 11, 7, 4 සහ 2 දරන බිම් කැබැලිවල සහ අංක පී. පී. 6135 දරන සැලැස්මේ 16 වැනි බිම් කැබැල්ලේ ද අංක 84842 දරන හිමිකම් පිඹුරේ ද බස්නාහිර මායිම ඔස්සේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

EOG 09 - 0038/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.